## 8. ශීර්ෂය 8 - ජාතික පොලිස් කොමිෂන් සභාව.

### 8.1 විගණන විෂය පථය

ජාතික පොලිස් කොමිෂන් සභාවේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත්පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2014 මැයි 12 දින කොමිෂන් සභාවේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයාගැනීම් විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකිවන පරිදි පිළියෙල කරන ලද්දකි.

### 8.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

### 8.3 විගණන නිරීක්ෂණය

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව ජාතික පොලිස් කොමිෂන් සභාවේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශ මෙහි (අ) හි දක්වා ඇති පොදු නිරීක්ෂණය සහ පහත 8.4 සිට 8.8 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

#### (අ) අයවැය විචලනය

වැය විෂයයන් 07 ක් සඳහා අධිප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 08 ත් සියයට 53 ත් අතර පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

## 8.4 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය

### 8.4.1 අභ්‍යන්තර විගණනය

ජාතික පොලිස් කොමිෂන් සභාවේ අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබුණි.

### 8.4.2 විගණන හා කළමනාකරණ කමිටුව ක්‍රියාත්මක කිරීම

කොමිෂන් සභාව විසින් විගණන හා කළමනාකරණ කමිටුව ස්ථාපිත කර ක්‍රියාත්මක කර නොතිබුණි.

## 8.5 වත්කම් කළමනාකරණය

**වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

2013 වර්ෂයට අදාල සමීක්ෂණ මණ්ඩල වාර්තා වලින් පෙන්වා දී තිබුණු ප්‍රයෝජනයට ගත නොහැකි භාණ්ඩ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 770 (2) සහ 771 (3) ප්‍රකාරව ක්‍රියාකර නොතිබුණි.

## 8.6 කාර්යසාධනය

**පැමිණිලි විමර්ශනය**

ජාතික පොලිස් කොමිෂන් සභාවේ කාර්යාල 11 ක් වෙත සමාලෝචිත වර්ෂයේ දී පහත පරිදි පැමිණිලි 414 ක් ලැබී තිබුණි.

| | පැමිණිල්ලේ ස්වභාවය | පැමිණිලි සංඛ්‍යාව |
|---|---|---|
| (අ) | පොලීසිය විසින් ක්‍රියානොකිරීම (උදාසීනත්වය) | 134 |
| (ආ) | බලය අයථා ලෙස පරිහරණය | 103 |
| (ඇ) | පක්ෂග්‍රාහීවීම | 83 |
| (ඈ) | වෙනත් | 30 |
| (ඉ) | පහරදීම | 14 |
| (ඊ) | නීතිවිරෝධී ලෙස රඳවාගැනීම | 21 |
| (උ) | බොරු චෝදනා කිරීම / සිරභාරයට ගැනීම | 17 |
| (ඌ) | වධහිංසා පැමිණවීම | 05 |
| (එ) | කාන්තාවන්ට හා ළමුන්ට හිංසාකිරීම | 04 |

| | | |
|---|---|---|
| (ඒ) | අල්ලස් හා දූෂණ | 03 |
| (ඔ) | පොලිස් අත්අඩංගුවේ දී මියයාම | - |
| | | ----- |
| | **එකතුව** | **414** |
| | | === |

සමාලෝචිත වර්ෂයේ දී එම පැමිණිලිවලින් 307 ක් හෙවත් සියයට 74 ක් විසඳා තිබුණි.

## 8.7 විමර්ශනවල ඵලදායීත්වය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දහහත් වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය අනුව පිහිටුවන ලද ජාතික පොලිස් කොමිෂන් සභාවේ බලතල දහඅට වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය නිසා අහෝසි වී ඇත. ඒ නිසා සමාලෝචිත වර්ෂය තුළ දී ජාතික පොලිස් කොමිෂන් සභාව වෙත ලැබුණු පැමිණිලි සම්බන්ධයෙන් ඍජුව ක්‍රියාත්මක වීමට නොහැකි වී තිබුණු අතර පරීක්ෂණයෙන් වරදකරුවන් ලෙස හඳුනාගත් නිලධාරීන් පිළිබඳ ඉදිරි කටයුතු කිරීම සඳහා එම තොරතුරු පොලිස්පතිවරයා වෙත යොමුකර තිබුණි.

## 8.8 මානව සම්පත් කළමනාකරණය

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2013 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 15 | 15 | - |
| (ii) | තෘතියික මට්ටම | 03 | - | 03 |
| (iii) | ද්වීතියක මට්ටම | 33 | 26 | 07 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 13 | 12 | 01 |
| | | ----- | ----- | ---- |
| | **එකතුව** | **64** | **53** | **11** |
| | | === | === | === |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 11 ක් පිරවීමට කොමිෂන් සභාව අපොහොසත් වී තිබුණි.

(ආ) තථ්‍ය සේවක සංඛ්‍යාව තුළ අනියම් හා කොන්ත්‍රාත් පදනම මත සිටින ජ්‍යෙෂ්ඨ මට්ටමේ නිලධාරීන් 13 ක්ද, ද්විතියික මට්ටමේ නිලධාරීන් 02 ක් හා ප්‍රාථමික මට්ටමේ එක් නිලධාරියෙක් ද ඇතුළත් වී තිබුණි.